# ECONOMIC HISTORY IN MEDIEVAL SRI LANKA (FROM 1232 A. D. TO 1467 A. D.)

J. M. Sudharmawathie

FGS/03/01/04/2008/01

Submitted to the Faculty of Graduate Studies for the Degree of Philosophy in History

University of Kelaniya

Sri Lanka

July 2017

# සංක්ෂේපය

ක්‍රි. ව. දහතුන්වන සියවසේ මුල් භාගයේදී මෙරට ඇති වූ දේශපාලන ව්‍යාකූලතාව ප්‍රමුඛ කරගෙන රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීමෙන් ලංකා ඉතිහාසයේ සෑම ක්ෂේත්‍රයක ම සැලකිය යුතු වෙනස්කම් සිදුවනු දැකිය හැකි ය. මෙම පර්යේෂණයේදී ක්‍රි. ව. 1232 සිට ක්‍රි. ව. 1467 දක්වා කාල පරිච්ඡේදය තුළ මෙරට ආර්ථිකයේ ස්වභාවය, එහි ඇති වූ වෙනස්කම් හා සුවිශේෂතා පරීක්ෂා කෙරිනි. ප්‍රස්තුත අවධියේ ආර්ථික ක්‍රියාවලිය සකස්වීම කෙරෙහි දේශපාලන හා සමාජ සංවිධානය බලපා ඇති හෙයින් එම ක්ෂේත්‍ර දෙක පිළිබඳව සංක්ෂිප්තව මෙහිදී සාකච්ඡාවට බඳුන් කර ඇත. මෙකල ආර්ථික ක්‍රියාවලිය කෘෂිකර්මාන්තය හා වෙළෙඳාම යන ප්‍රධාන ප්‍රවාහ දෙක මත ගොඩනැංවී තිබිණි. මහාපරිමාණ වාරි කර්මාන්ත නොමැති වුව ද එකල මඩ වී ගොවිතැන හා ගොඩ වී ගොවිතැන පවත්වාගෙන ගොස් තිබේ. එහිදී වැසිඑල මත මෙන් ම කුඩා දියපාරවල් උපයෝගී කරගනිමින් ද ගොවිතැන් කටයුතු සිදු කර තිබේ. වී පමණක් නොව වෙනත් ධාන්‍ය වර්ග ද එළවළු ආදී අනෙකුත් අවශ්‍ය ද්‍ර ද ගේන් හා ගෙවතු වගා මගින් සපුරා ගෙන ඇත. එපමණක් නොව කෘෂිකර්මාන්තය උදෙසා මෙන් ම තවත් අවශ්‍යතා උදෙසා ගව පාලනය පවත්වා ගෙන ගොස් තිබේ. මේ කාලයේදී පොල් වගාව කෙරෙහි ද නැඹුරුවක් පැවතිණි. මේ අනුව ප්‍රස්තුත අවධියේ ලාංකිකයෝ ප්‍රධාන ජීවනෝපාය වශයෙන් කෘෂිකර්මාන්තයේ නියුක්ත වූහ. කෘෂිකර්මාන්තය හැරුණු කල ආර්ථික ක්ෂේත්‍රයේ අනෙක් අංශය වූයේ වෙළෙඳාම යි. අභ්‍යන්තර හා අන්තර්ජාතික වෙළෙඳාම ලංකා ආර්ථිකයේ වැදගත් අංගයක් බවට පත් වී ඇත. බහුලව ම වෙළෙඳ ද්‍රව්‍ය හුවමාරුව යටතේ ත් යම් ප්‍රමාණයකට කාසි භාවිතය මගිනුත් දිවයිනේ සෑම ප්‍රදේශයක ම පාහේ වෙළෙඳාම් කටයුතු පවත්වාගෙන ගොස් තිබේ. මෙහිදී මෙරට දෑ මෙන් ම විදේශයෙන් ගෙන්වන දෑ ද තලවම්, ඔරු, පාරු ආදී ක්‍රම ඔස්සේ ප්‍රවාහනය කරමින් හුවමාරුව ක්‍රියාශීලි අන්දමින් පවත්වාගෙන යාමට දෙස් විදෙස් වෙළෙඳුන් සමත් විය. විදේශ වෙළෙඳාම් කටයුතු පෙරට වඩා සක්‍රීය අන්දමින් සිදු කෙරිණි. ඈත අතීතයේ පටන් ම ලංකාව අපනයනය කළ මුතු, මැණික්, ඇතුන් ආදියට අමතරව මෙකල කුරුඳු, ගම්මිරිස් ආදී කුළුබඩුවලට විදේශ ඉල්ලුමක් ඇතිවීම දක්නට ඇති ප්‍රධාන කරුණකි. මේ අවධියේ විදේශ වෙළෙඳාමෙහි නිරතවූවන් අතරට මුස්ලිම් වෙළෙඳුන්ගේ පැමිණීම වෙළෙඳ කටයුතු තවදුරටත් ක්‍රියාකාරීව පවත්වාගෙන යෑමට හේතුවක් විය. මෙකල දිවයිනේ දකුණු හා බටහිර වෙරළේ පිහිටි වරාය භාවිතයට ගැනීම ද දැකිය හැකි ය. එම ප්‍රදේශයේ පිහිටි සෑම වරායක් ම වැදගත්කමින් අනූන විය. තව ද මෙකල ඇති වූ සුවිශේෂී තත්ත්වයක් නම් වරාය ආශ්‍රිතව වෙළෙඳ නගර ගොඩනැගීම හා මේ නගර ආශ්‍රිතව විදේශීය වෙළෙඳුන් හා නාවික කටයුතුවල නිරත වූ විදේශිකයන් සිය වාසස්ථාන පිහිටුවාගෙන වාණිජ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම ය. එමෙන් ම කිරුම් මිණුම් ක්‍රම ආදිය වෙළෙඳාම් කටයුතු කරගෙන යෑමේදී භාවිතයට ගෙන ඇත. මධ්‍යතන අවධියේ ආර්ථික ඉතිහාසය තුළ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව පවත්වාංගැනීමට ලාංකිකයන් උත්සාහ දරා ඇති අතර පෙරදිගින් හා අපරදිගින් පැමිණෙන වෙළෙඳුන් හමුවන වෙළෙඳ මධ්‍යස්ථානයක් ද වෙමින් ලංකාව ආනයන හා අපනයන වෙළෙඳාමෙහි වැදගත් ස්ථානයක් හිමි කරගෙන තිබූ අන්දම මැනවින් පෙන්නුම් කරයි.

මුඛ්‍ය පදඃ *ආර්ථික ක්‍රමය, කෘෂිකර්මාන්තය, මධ්‍යතන අවධිය, වෙළෙඳාම, ශ්‍රී ලංකාව*

## Abstract

As a consequence of the shift of the kingdoms to the South-west due to the political dilemma which occurred during the first half of the 13th century AD, substantial changes took place in every field. This research study examined the nature, changes which were taken place and the special characteristics of the economy of Sri Lanka from 1232 A.D. to 1467 AD. It is undoubted that the functioning of political and social organization affect the formation of the economy. Hence, a brief discussion on those fields were also included. Economy of the country during this period of time had been based on two streams, namely agriculture and trade. Although there were no large scale irrigation works, wet land cultivation and *chena* cultivation were carried out. Rain water and small streams were used as sources of water supply for agriculture. In addition to paddy, other grains, vegetables etc. were cultivated in *chenas* and home gardens. Cattle rearing were also carried out for agriculture and other purposes. Coconut cultivation was also popular during this period. Therefore, it can be said that Sri Lankans were engaged agriculture as their main livelihood during this time. Apart from agriculture, the other noteworthy aspect of the economy was trade. Internal trade and international trade were important aspects of trade. Trade was carried out in almost all the areas of the island either mainly through barter system or to some extent by using money as a medium of exchange. Traders, both local and foreign, were able to carry out trading actively by transporting the goods which were imported from foreign countries by using *thavalams* and boats. International trade was more developed during this period. One of the main attractions, apart from goods such as pearls, precious stones, elephants which were exported by Sri Lanka since the ancient times, was spices. There was high demand for cinnamon and pepper from overseas countries. Another reason for the development of trade activities was the involvement of Muslim traders in trade. All ports in Southern and Western Sri Lanka played very important role in trade. Another special feature during this time was the formation of commercial cities near ports and the establishment of dwellings of foreign traders and naval officers in these cities facilitating the development of trade. Various weights and measures were used in trading activities. These factors indicate that during the Medieval Period, Sri Lankans tried to maintain a self-sufficient agricultural economy while Sri Lanka was a trading center where traders from the East and the West met. This resulted in Sri Lanka becoming an important center of import-export trade.

Keywords: Agriculture, Economic System, Medieval Period, Sri Lanka, Trade